# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/Pen.Com | | 2019.10.24 |

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම.</u>**

උක්ත කරුණට අදාළව විශ්‍රාම ගිය හා මිය ගිය නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විෂයය භාර නිලධාරීන් මේ වන විටත් දැනුවත් කර ඇත.

02. ඒ අනුව මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ට අදාළ විශ්‍රාම වැටුප් ගොනු මාර්ග ගත ක්‍රමය යටතේ (Online) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කොට ඇති විශ්‍රාම වැටුප් සැකසීමේ ඒකකය මගින් පමණක් සිදු කළයුතු බවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබාදී ඇති බව ඔබ ද දන්නා කරුණකි.

03. එමෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගේ පමණක් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලේ ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමෘද්ධි ආයතන විෂය භාර නිලධාරීන් මගින් සිදු කළ හැකි බවද දන්වමි.

04. එසේ වුවද වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ලියාපදිංචි කටයුතු සඳහා සකස් කර ගන්නා User Name, Password මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනෙකුත් පද්ධතිවලට පිවිසීමෙන් වැලකී සිටින ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |